# දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාගය 2022

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මඟින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාගය 2022/06/18 දින දිවයින පුරා විභාග මධ්‍යස්ථාන 25 කදි පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

02. මේ සඳහා අයදුම්පත් යොමු කිරීම සම්බන්ධයෙන් ගුරුභවතුන් දැනුවත් කිරීම සඳහා සකස්කරන ලද දැන්වීම හා මාර්ගගත (On-line) අයදුම් පත්‍රයේ QR කේතය මේ සමඟ එවමි. චක්‍රලේඛයේ උපදෙස්වලට අනුව සුදුසුකම් සහිත දහම් පාසල් ගුරුභවතුන්ගේ **අයදුම්පත් 2022.03.15 දිනට පෙර මාර්ගගත (On-line) ක්‍රමයට** මා වෙත යොමු කරන මෙන් කාරුණිකව දැනුම් දෙමි.

03. මෙම දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කර ඇති **මාර්ගගත (On-line) අයදුම් පත්‍රය භාවිත කරමින් විභාගය සඳහා අයදුම් කර එහි පිටපතක් ප්‍රධානාචාර්ය විසින් සහතික කර බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතු අතර,** එසේ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව වැඩිදුරටත් කාරුණිකව සැලකුව මැනවි.

04. 2020-2021 වර්ෂය සඳහා සංවිධානය කරනු ලැබූ දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාගය 2021/06/19 දින පැවැත්වීමට කටයුතු සංවිධානය කර තිබූ නමුත් දිවයිනේ උද්ගතව පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් එදින එම විභාගය පැවැත්වීමට නොහැකි විය. **2020 හා 2021 වර්ෂයේ විභාගය සඳහා අයදුම් කරනලද අයදුම්කරුවන් නැවත 2022 වර්ෂයේ විභාගය සඳහා අයදුම් කළ යුතුවේ.**

සුනන්ද කාරියප්පෙරුම
බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්

# දැන්වීමයි

## බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
## බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

# දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාගය

**ශ්‍රී බු. ව. 2565 - 2566 ( ව්‍ය. ව. 2022 )**

දහම් දැනුමෙන් පෝෂණය වූ සාරධර්ම සපිරි දරු පරපුරක් බිහිකිරීමෙහිලා නිශ්ශරණාධ්‍යාශයෙන් කැප වී සිටින දහම් පාසල් ගුරුභවතුන්ගේ සුදුසුකම් ඉහළ නැංවීම, සේවය අගය කිරීම, උසස් අධ්‍යාපනයට නැඹුරු කිරීම මගින් සමාජ පිළිගැනීම ලබා දීම අරමුණු කරගෙන බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන, උක්ත විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව පහත උපදෙස් ප්‍රකාරව සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අයදුම්පත්‍ර යොමු කළ යුතුය.

### 01. විභාගය පවත්වන ආකාරය හා දිනය

2022 වර්ෂයට අදාළ ගුරු සහතික පත්‍ර විභාගය **2022 ජූනි මස 18** වන දින බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සෘජු අධීක්ෂණය යටතේ පවත්වනු ලැබේ. විභාගය සිංහල මාධ්‍යයෙන් පැවත්වේ. විභාග මධ්‍යස්ථාන තීරණය කරනු ලබන්නේ විභාගයට ඉදිරිපත්වන අයදුම්කරුවන් සංඛ්‍යාව අනුව වේ.

### 02. විභාගයට අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම්

i. 2022. 03. 15 දිනට අවම වශයෙන් මාස 06 ක් අඛණ්ඩව බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි දහම් පාසලක ගුරුභවතෙකු ලෙස සේවය කර තිබීම.

ii. වයස අවුරුදු 18 ට වැඩි වීම.

### 03. විභාගය සඳහා අයදුම් කිරීම.

i. අදාළ අයදුම්පත මේ වන විට අන්තර්ජාලය වෙත මුදාහැර ඇති අතර පරිගණකයක්, ටැබ් යන්ත්‍රයක් හෝ ස්මාට් දුරකථනයක් භාවිත කරමින් මාර්ගගත (On- line) ක්‍රමයට අයදුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමට පහසුකම් සලසා ඇත.

ii. පහත සඳහන් ක්‍රමවේද මඟින් අයදුම් පත්‍රය වෙත ප්‍රවේශ විය හැකිය.

- බෞද්ධ කටයුතු දෙපාර්තාමන්තුවේ (www.dba.gov.lk) වෙබ් අඩවියේ මුල් පිටුවේ (Home Page) සඳහන් **"දහම් පාසල් ගුරුසහතික පත්‍ර විභාගය 2022"** වෙත පිවිස එහි ඇති සබැදිය (link) භාවිත කරමින් හෝ,
- මෙම දැන්වීමෙහි ඇති QR කේතය ස්කෑන් කිරීමෙන් හෝ,
- අයදුම් පත්‍රයෙහි සබැදිය (link) බෞද්ධ කටයුතු නිලධාරි මඟින් ඔබේ පරිගණකයට හෝ ස්මාට් දුරකථනයට e-.mail, WhatsApp, Micrsoft Teams වැනි සේවාවන් මාර්ගයෙන්ද ලබා ගෙන, ඒ මගින් අයදුම්පතට ප්‍රවේශ විය හැකිය.

**iii.** අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2022 **මාර්තු මස** 15 වේ. ඉන් පසු ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**iv.** **මාර්ගගත (On-line) ක්‍රමය ඔස්සේ අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීමෙන් පසු අයදුම්පත්‍රයේ මුද්‍රිත පිටපතක් ලබා ගෙන ගරු ප්‍රධානාචාර්ය මඟින් සහතික කර බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්, බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, "දහම් පාය" , අංක 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,කොළඹ 07. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන්නට සැලැස්විය යුතුය.** අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාගය 2022 "** යනුවෙන් සඳහන් කළ යුතුය.

**v.** මාර්ගගත (On-line) ක්‍රමයට අයදුම් පත්‍ර ඉදිරිපත් කිරීමට පහසුකම් සලසා ඇති බැවින් තැපැල් මඟින් අයදුම් පත්‍ර ඉදිරිපත් කිරීම, **අසම්පූර්ණ ලෙස පුරවා ඇති මාර්ගගත (On-line) අයදුම් පත්‍ර,** නියමිත දිනයට අයදුම් පත්‍රයක් ඉදිරිපත් නොකිරීම, සාවද්‍ය තොරතුරු සැපයීම අයදුම්කරු වෙත කරුණු නොදන්වා ඉල්ලුම් පත්‍රය ඉවත් කරනු ලැබීමට හේතු වේ. **එහෙයින් බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර ඇති මාර්ගගත (On- line) ක්‍රමයට පමණක් අයදුම් කළ යුතුය. එසේ නොවන සියලුම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**vi.** ***2020 හා 2021 වර්ෂයට අදාළව පැවැත්වීමට නියමිතව තිබූ දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාගය දිවයිනේ උද්ගතව පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් 2021 වර්ෂයේ නොපැවැත්වූ අතර එම විභාගය සඳහා අයදුම්කර තිබූ විභාග අයදුම්කරුවන් 2022 වර්ෂයේදී පවත්වන විභාගය සඳහා නැවත අයදුම් කළ යුතු බව අවධාරණය කරමි***

**vii.** අයදුම්කරුවන් 200 ක් හෝ ඊට වැඩි පිරිසක් ඇති සෑම දිස්ත්‍රික්කයක් සඳහා ම එක් විභාග මධ්‍යස්ථානය බැගින් ස්ථාපිත කරනු ලැබේ. ඊට අඩු අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත්වන දිස්ත්‍රික්කවල අයදුම්කරුවන් යාබද දිස්ත්‍රික්කයේ විභාග මධ්‍යස්ථානයට අනුයුක්ත කරනු ලැබේ.

**යෝජිත විභාග මධ්‍යස්ථාන ලේඛනය පහත දක්වා ඇත.**

| දිස්ත්‍රික්කය | විභාග මධ්‍යස්ථාන | දිස්ත්‍රික්කය | විභාග මධ්‍යස්ථාන |
|---|---|---|---|
| කොළඹ | කොළඹ | කුරුණෑගල | කුරුණෑගල |
| | | | පඩුවස්නුවර |
| ගම්පහ | ගම්පහ | පුත්තලම | පුත්තලම |
| කළුතර | කළුතර | අනුරාධපුර | අනුරාධපුර |
| මහනුවර | මහනුවර | පොළොන්නරුව | පොළොන්නරුව |
| මාතලේ | මාතලේ | මොනරාගල | මොනරාගල |
| නුවරඑළිය | නුවරඑළිය | බදුල්ල | බදුල්ල |
| | | | බණ්ඩාරවෙල |
| ගාල්ල | ගාල්ල | රත්නපුර | රත්නපුර |
| මාතර | මාතර | කෑගල්ල | කෑගල්ල |
| හම්බන්තොට | හම්බන්තොට | ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය |
| | තංගල්ල | | |
| අම්පාර | අම්පාර | | |

## 04. ප්‍රශ්න පත්‍රයේ සංයුතිය හා ඇගයීම

**i.** ප්‍රශ්න පත්‍ර සඳහා පාදක කර ගනු ලබන්නේ දහම් පාසල්වල දැනට භාවිත වන 1 වන ශ්‍රේණිය සිට 10 වන ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල පෙළ පොත් ගුරු අත්පොත් හා දහම් පාසල් කලමනාකරණය පොතයි.

**ii.** **ප්‍රශ්න පත්‍රයේ සංයුතිය**

ප්‍රශ්නපත්‍රයට පිළිතුරු ලිවීමට ලබා දෙන කාලය පැය 03 කි. ප්‍රශ්නපත්‍රය I, II, III, යනුවෙන් කොටස් තුනකින් යුක්ත වේ. I කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු අතර II හා III කොටස්වලින් එක් කොටසකින් **අවම වශයෙන්** එක් ප්‍රශ්නයක් ඇතුළත් වන සේ II හා III කොටස්වලින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතුය.

*I* **කොටස**

මෙම කොටස කෙටි ප්‍රශ්න 10 කින් යුක්ත වන අතර, ඒ සඳහා අනිවාර්යයෙන් ම සැපයිය යුතු වේ. ලකුණු (2 x10 = 20)

*II* **කොටස**

මෙම කොටසෙන් එක් ප්‍රශ්නයක් අනිවාර්යයෙන් ඇතුළත් වන පරිදි ප්‍රශ්න තොරාගතයුතු ය. ඉගැන්වීමේ ක්‍රමවිද්‍යාව, බුද්ධ චරිතය, චරිත කථා අධ්‍යාපනය, ශාසන ඉතිහාසය, බෞද්ධ සංස්කෘතිය යනාදිය විෂය කරගත් රචනා ශෛලියේ ප්‍රශ්න කිහිපයකින් යුක්ත වේ.
(එක් ප්‍රශ්නයකට ලකුණු 20ක් හිමිවේ).

*III* **කොටස**

මෙම කොටසෙන් එක් ප්‍රශ්නයක් අනිවාර්යයෙන් ඇතුළත් වන පරිදි ප්‍රශ්න තෝරාගත යුතු ය. අභිධර්මය, පාලි, භාවනා යනාදිය විෂය කර ගනිමින් රචනා ශෛලියේ ප්‍රශ්න කිහිපයකින් යුක්ත වේ.
(එක් ප්‍රශ්නයකට ලකුණු 20 ක් හිමි වේ).

ප්‍රශ්න පත්‍රයේ මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 100ක් වන අතර සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 35ක් ලබා ගත යුතුය.

සාමර්ථ්‍යයන් පහත සඳහන් පරිදි වර්ග කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| 01 - 34 | දුර්වල | 65 - 74 | අධිසම්මාන සාමර්ථ්‍යය |
| 35 - 49 | සාමාන්‍ය සාමර්ථ්‍යය | 75 - 100 | විශිෂ්ට සාමර්ථ්‍යය |
| 50 - 64 | සම්මාන සාමර්ථ්‍යය | | |

## 05. විභාගයට ඉදිරිපත් වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම.

**i.** සුදුසුකම් ඇති සියලු ම අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍රය අයදුම් පත්‍රයේ සඳහන් ලිපිනයට තැපැල් මගින් එවනු ලැබේ. නිසිපරිදි සම්පූර්ණ කරනලද ප්‍රවේශ පත්‍රය ගරු ප්‍රධානාචාර්ය මගින් සහතික කර විභාග දිනයේ දී ශාලාධිපතිට ඉදිරිපත් කළ යුතුය.
**එමෙන්ම** විභාගයේ දී සිය අනන්‍යතාව තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් **හෝ** විභාගය පැවැත්වෙන අවස්ථාවේ ඉදිරිපත් කළ යුතුවේ. එසේ නොකරන ලද අයදුම්කරුවන්ගේ විභාග ප්‍රතිඵල අත්හිටුවනු ලැබේ.

*1.* **ජාතික හැඳුනුම්පත**

*11.* **වලංගු විදේශ ගමන් බලපත්‍රය**

*111.* **දහම් පාසල් ගුරු හැඳුනුම්පත**

*1V.* **තැපැල් හැඳුනුම්පත**

*V.* **වලංගු රියැදුරු බලපත්‍රය**

**ii.** විභාගය සඳහා පෙනීසිටින අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල අයදුම් පත්‍රයේ ලිපිනයට තැපැල් මගින් 2022.10.30 වන දිනයට පෙර නිකුත් කිරීමට සැලසුම් කර ඇත.

## 06. වෙනත් කරුණු

**i.** මෙම විභාගය සමත් වන ගුරුභවතුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් හෝ බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයෙන් පවත්වා ගෙන යනු ලබන දහම් සරසවිය ඩිප්ලෝමා සහතික පත්‍ර විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබනු ඇත.

**ii..** විභාගය පැවැත්වීම අවලංගු කිරීම හෝ විභාගය සම්බන්ධ අවසාන තීරණ ගැනීමේ පූර්ණ බලතල බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් සතු වේ.

මේ පිළිබඳ කරුණු පැහැදිලි කර ගැනීමක් හෝ විමසීමක් වෙතොත් බෞද්ධ කටයුතු කොමසාරිස් (දහම් පාසල්) වෙත ඉදිරිපත් කළ යුතු වේ.

(**විමසීම් :- 0112 337338** )



සුනන්ද කාරියප්පෙරුම

බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්

**අයදුම්පත ලබා ගැනීමට මෙම යොමුව ( link ) භාවිත කරන්න.**

https://forms.office.com/r/pdZiaP0ePa